# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1739/15 – 2012 ජනවාරි 04 වැනි බදාදා – 2012.01.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/20/26/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ලංකා වෙළඳ කාර්මික හා පොදු කම්කරු සංගමය (C. M. U.), (ඩබ්. කේ. එස්. විජේරත්න මහතා වෙනුවෙන්), අංක 03, 22 වන පටුමග, කොළඹ 03.

සහ

පීරාමල් ග්ලාස් සිලෝන් පී. එල්. සී., අංක 148, මාලිගාව පාර, බොරුපන, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 05, කිරුළපන ඇවනිව්, අංක 153/1හි, වී. විමලරාජා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.


1A – G 15512 – 370 (2012/01)

මගේ අංකය: IR/20/26/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා වෙළඳ කාර්මික හා පොදු කම්කරු සංගමය (C. M. U.), (*ඩබ්. කේ. එස්. විජේරත්න මහතා වෙනුවෙන්*), අංක 03, 22 වන පටුමග, කොළඹ 03.

සහ

පීරාමල් ග්ලාස් සිලෝන් පී. එල්. සී., අංක 148, මාලිගාව පාර, බොරුපන, රත්මලාන.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ –**

"පීරාමල් ග්ලාස් සිලෝන් පී. එල්. සී. හි සේවය කරන ඩබ්. කේ. එස්. විජේරත්න මහතා 2009.10.26 දින සිට ආයතනයේ සැපයුම් අංශයට මාරු කර යැවීමෙන් හා ඔහු එවකට සේවය කළ අයකැමි තනතුරෙහි නොයෙදවීමෙන් සේවක මහතාට යම් අගතියක් සිදුවූයේ ද, එසේ වූයේ නම් කුමන සහන හිමිවිය යුතුද යන්නත් වේ".

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 - 449

---

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිළියන්දල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77 හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිළියන්දල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර ඇති **කාර්මික** ආරාවුලට **හේතු වී පවත්නා කරුණු** වනුයේ,

(i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආරක්ෂක අංශ සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ දී / පුරප්පාඩු පිරවීමේ දී පිටතින් සේවකයින් බඳවා ගැනීම තුළ සුදුසුකම් ලත් ආයතනයේ සේවකයින්ට අවස්ථාවක් නොලැබීම.

(ii) ආරක්ෂක නියාමක 1 ශ්‍රේණියේ නිලධාරීන් විශාල පිරිසක් සඳහා උසස්වීම් නොලැබීම හා සුදුසුකම් සපුරා ඇතත් එම තනතුරේම විශ්‍රාම යාමට සිදුව තිබීම.

(iii) සමහර ආරක්ෂක නිලධාරීන්ට උසස්වීම් පටිපාටිය උල්ලංඝණය කරමින් උසස්වීම් ලබා දීම.

(iv) විශ්‍රාම ගැන්වීමට පෙර ආරක්ෂක නියාමක 1 ශ්‍රේණියේ නිලධාරීන්ට හිමි උසස්වීම් ලබා ගැනීම.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 - 450

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.